## මන්නාරම ප්‍රාදේශිය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 12 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 12 දින ඉදිරිපත් කරන ලදි.

#### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මන්නාරම ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මන්නාරම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

##### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.

##### 1.3.2 ගණකාධිකරණ අඩුපාඩු

වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන් හි නිරීක්ෂණය වූ ගණකාධිකරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ මත බලපෑම | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| වැඩියෙන් දැක්වීම් | 01 | 30,012,575 | - | - |
| අඩුවෙන් දැක්වීම් | - | - | 02 | 1,258,510 |

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 96,543,465 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණයකට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන)රීති - 1988 | |
| 111 පරිච්ඡේදයේ 65 වගන්තිය | ආදායම් ලිපිකරු විසින් පැහැර හරින්නන් පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 111 පරිච්ඡේදය 66 වගන්තිය | සභාවේ හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු. 894,404 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු. 5,793,650 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2011 | |
| --- | --- | --- |
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය |
| | රු"000 | රු" 000 |
| වරිපනම් සහ බදු | 176 | 235 |
| කල්බදු කුලී | 2,706 | 2,356 |
| බලපත්‍ර ගාස්තු | 501 | 235 |
| වෙනත් ආදායම් | 13,655 | 15,988 |
| | 17,038 | 18,814 |

#### 2.2.2 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

(අ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ වෙනත් ආයතනයන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු. 23,330 ක් විය.

(ආ) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙතින් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි.

2.2.3 කාර්ය සාධනය

සභාව මුදල් වර්ෂය ආරම්භයේදී වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එම නිසා අපේක්ෂිත අරමුණු සහ ඒවායේ ප්‍රගතිය සොයා දැන ගැනීමට නොහැකි විය.

3. පද්ධති සහ පාලන

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරනු ලැබේ

(අ) ආදායම් රැස්කිරීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) ප්‍රදාන
(ඉ) වාහන උපයෝජනය
(ඊ) තැන්පතු
(උ) අයවැය ලේඛනය